# HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් වැඩසටහන සඳහා නීතිරීති හා කොන්දේසි

**1.0** අර්ථනිරූපණ

1.1. "සුදුසුකම් ලත් කාඩ්පත් හිමියන්/කාඩ්පත් හිමියන්" යන්නෙන්, පහත දක්වා ඇති පුද්ගල කාණ්ඩ හැර, HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් වල අලුත් හෝ දැනට සිටින සියලුම ප්‍රාථමික සහ/හෝ අතිරේක කාඩ්පත් හිමියන් අදහස් වේ:

a. ශ්‍රී ලංකාවේ දී නිකුත් නොකළ HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් වල කාඩ්පත් හිමියන්;

b. අවලංගු හෝ අවලංගු කරන ලද HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් වල කාඩ්පත් හිමියන් සහ/හෝ යහපත් තත්ත්වයක නොමැති ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම්;

c. ආයතනික සහ/හෝ ව්‍යාපාරික HSBC ක්‍රෙඩිට් කාඩ්පත් වල කාඩ්පත් හිමියන්.

1.2. "HSBC/Bank" යන්නෙන්, ද හොංකොං ඇන්ඩ් ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ්, ශ්‍රී ලංකා ශාඛාව යනුවෙන් අදහස් වේ.

1.3. HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත/ ක්‍රෙඩිට් කාඩ්පත යනුවෙන් අදහස් වන්නේ බැංකුවෙහි හඳුනාගැනීමේ අංකය ("BIN") 4720 76 හෝ 4679 13 න් පටන් ගෙන ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් වේ.

1.4. 2019 HSBC Rewards මල්ටිප්ලයර් වැඩසටහන (මෙතැන් සිට "ප්‍රවර්ධන වැඩසටහන" ලෙස හැඳින්වේ) 2019 ජූලි 15 වන දින සිට HSBC විසින් අවසන් කරන තෙක් (මෙතැන් සිට "ප්‍රවර්ධන කාලසීමාව" ලෙස හැඳින්වේ) බලපැවැත්වේ.

1.5. "වැඩසටහන" යන්නෙන් HSBC Rewards ක්‍රෙඩිට් කාඩ්පත් වැඩසටහන අදහස් වේ.

1.6. "Rewards ලකුණු" හෝ "RP" යනු දේශීයව සහ විදේශීයව ඕනෑම වෙළඳ අලෙවිසැල් වල සිදුකළ ගනුදෙනු සඳහා HSBC ක්‍රෙඩිට් කාඩ්පතක් භාවිතයෙන් උපයාගත්, අය කරන ලදුව සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට බැර කරන ලද HSBC ත්‍යාග ලකුණු වේ. Rewards වැඩසටහනේ මූලික මිනුම් ඒකකය මෙයයි.

**2.0** **Rewards** ලකුණු උපයා ගැනීම

2.1 පහත දක්වා ඇති ගනුදෙනු හැර, සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට අය බැර කෙරෙන සෑම රු.200/- ගනුදෙනුවක් සඳහාම Rewards ලකුණු ප්‍රදානය කෙරේ:

a. බැංකුවේ තීරුබදු සහ ගාස්තු අනුව ගාස්තු සහ ගාස්තු සහ අදාළ බදු, ඇත්නම්; සහ/හෝ

b. මුදල් අත්තිකාරම්, ශේෂය පැවරීම, මුදල් වාරික සැලැස්ම, ශේෂ පරිවර්තන සැලැස්ම සහ, සහ/හෝ

c. කැසිනෝ, සූදු ගනුදෙනු, දේශීයව, විදේශීයව හෝ ඔන්ලයින් මගින් සිදු කරන ලද ක්‍රිප්ටෝ ව්‍යවහාර මුදල් ගනුදෙනු.

2.2 අනෙකුත් සෑම වියදමකදීම 1x RP වලට අමතරව, ක්‍රෙඩිට් කාඩ්පත භාවිත කරන වාරයක් හැර වාරයක් පාසා, සෑම රු.200/- ක් සඳහාම සුදුසුකම් ලත් කාඩ්පත් හිමියන්ට පහත කාණ්ඩ සඳහා "ත්‍යාග ගුණකයන්" ලැබෙනු ඇත (මෙතැන් සිට "සුදුසුකම් සහිත වියදම්" ලෙස හැඳින්වේ).

| වියදම් කාණ්ඩය | **Rewards** ලකුණු ගුණකය | රු. 200ක ට උපයා ගත් සමස්ත **Rewards** ලකුණු ගණන | රු. 2000ක ට උපයා ගත් සමස්ත **Rewards** ලකුණු ගණන | රු. 20000ක ට උපයා ගත් සමස්ත **Rewards** ලකුණු ගණන |
|---|---|---|---|---|
| ඇඳුම් | 5 X | 5 | 50 | 500 |
| ආහාර | 5 X | 5 | 50 | 500 |
| විද්‍යුත්-වාණිජ (e-commerce) | 5 X | 5 | 50 | 500 |
| රක්ෂණ | 2 X | 2 | 20 | 200 |
| වෛද්‍ය | 2 X | 2 | 20 | 200 |
| ප්‍රවාහන | 2 X | 5 | 50 | 500 |
| අධ්‍යාපන | 2 X | 2 | 20 | 200 |

2.3 VISA Worldwide Pte Limited (VISA) /Master Card Incorporated (MasterCard) සහ HSBC මාර්ගෝපදේශ මත පදනම්ව පෙර-නිශ්චිත වෙළඳ ප්‍රවර්ග කේත ("MCC") වලට පහත සඳහන් පරිදි Rewards ගුණකයන් අදාළ වේ. මෙහි **2.4** වගන්තියේ සඳහන් පරිදි පහත සඳහන් නිශ්චිත MCC කේතය යටතට නොවැටෙන ඕනෑම ගනුදෙනුවක් සඳහා Rewards ගුණක ප්‍රදානය නොකළ යුතුය.

2.4 ආහාර-පාන සඳහා වන සුදුසුකම් ලත් ගනුදෙනු යන්නෙන් අදහස් වන්නේ සියලුම දේශීය ආහාර-පාන අලෙවිසැල් වල සිදු කරන ගනුදෙනු වන අතර, අවන්හල්/භෝජන වෙළෙන්දන් (බැංකුව සහ VISA/MasterCard විසින් අර්ථ දක්වා ඇති පරිදි) ලෙස අර්ථ දක්වා නොමැති වෙළඳ කේත සහිත වෙළෙන්දන් සමග කරන ගනුදෙනු ද, හෝටල් භෝජන සංග්‍රහ, පුද්ගලික සාද /උත්සව, පෞද්ගලික කුටිවල උත්සව, පෞද්ගලික මුළුතැන්ගෙය /සුපිරි වෙළඳසැල්/ විවිධ භාණ්ඩ අලෙවිකරන විශාල වෙළඳායතන, සංගම්වල / ක්ලබ් හවුස්වල ගනුදෙනු හෝ වෙළඳ

කේත සමග අදාළ ව්‍යාපාරයේ යෝග්‍ය වෙළඳ කේත ලෙස අදාළ බැංකු විසින් අර්ථ දක්වා නොමැති තනි පුද්ගල වෙළඳුන් හෝ අනවසර ගනුදෙනු ද එයින් බැහැර කළ යුතුය.

| වෙළඳ ප්‍රවර්ග | වෙළඳ ප්‍රවර්ග කේත | **Rewards** ලකුණු ගුණකය |
|---|---|---|
| ඇඳුම් | 5137 | |
| | 5311 | |
| | 5331 | |
| | 5611 | |
| | 5621 | |
| | 5631 | |
| | 5651 | |
| | 5661 | |
| | 5691 | |
| | 5697 | |
| | 5698 | |
| | 5699 | |
| | 5712 | |
| | 5977 | |
| | 5999 | |
| | 7296 | 5 X |
| ආහාර-පාන ගැනීම් | 5462 | 5X |
| | 5499 | |
| | 5811 | |
| | 5812 | |
| | 5814 | |
| රක්ෂණ | 5960 | 2X |
| | 6300 | |
| වෛද්‍ය | 4119 | 2X |
| | 5912 | |
| | 5975 | |
| | 5976 | |
| | 7298 | |
| | 8011 | |
| | 8021 | |
| | 8031 | |
| | 8041 | |
| | 8049 | |
| | 8050 | |
| | 8062 | |
| | 8071 | |
| | 8099 | |
| | 8042 | |
| | 8043 | |
| ප්‍රවාහන | 3351 | 5X |

| | | |
|---|---|---|
| | 3355 | |
| | 3357 | |
| | 3359 | |
| | 3366 | |
| | 3368 | |
| | 3381 | |
| | 3387 | |
| | 3389 | |
| | 3390 | |
| | 3393 | |
| | 3395 | |
| | 3405 | |
| | 3409 | |
| | 3412 | |
| | 3441 | |
| | 4111 | |
| | 4112 | |
| | 4121 | |
| | 4131 | |
| | 4789 | |
| | 7512 | |
| අධ්‍යාපන | 7372 | 2X |
| | 8211 | |
| | 8220 | |
| | 8244 | |
| | 8249 | |
| | 8299 | |
| | 8351 | |
| MCC විසින් නොව “TXN TYPE” විසින් නිර්ණය කළ විද්‍යුත් වාණිජ (e-commerce) | | 5X |

2.5 ගනුදෙනුවක් වෙළඳ ප්‍රවර්ග දෙකක් හෝ වැඩි ගණනක් යටතේ වැටේ නම්, සුදුසුකම් ලත් කාඩ්පත් හිමියා පහළ ගුණකය මත පදනම්ව Rewards ලකුණු (RP) උපයනු ඇත. උදා: කාඩ්පත් හිමියා අන්තර්ජාලය හරහා රක්ෂණ ගෙවීම් සිදු කරයි - එම ගනුදෙනුව සඳහා කාඩ්පත් හිමියා 2x RP උපයනු ඇත.

2.6 HSBC විසින් කලින් කලට, එහි පරම අභිමතය පරිදි, HSBC Rewards ගුණකයන්ට ඇතුළත් කරනු ලැබීමට සුදුසුකම් ලබන වියදම් කාණ්ඩ මොනවාද යන්න සහ එක් එක් කාණ්ඩය

කොපමණ ප්‍රතිලාභ ගුණකයන් උපයන්නේද, ඉපැයීම් ආශ්‍රිත සීමාවන් මෙන්ම Rewards ලකුණු පිරිමිදීම සඳහා අවශ්‍ය Rewards ලකුණු ගණන ද තීරණය කළ යුතුය.

2.7 ප්‍රතිලාභ ලකුණු පිරිමිදීම හෝ පරිවර්තනය කිරීම සිදු කරනු ලබන්නේ කාඩ්පත් හිමියා ත්‍යාග ලකුණු **4000**ක් රැස් කරගත් පසුව පමණකි.

2.8 සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට බැර කර ආසන්නතම රුපියල දක්වා වැටයීම් කරන ලද ගනුදෙනුව මත පදනම්ව Rewards ලකුණු ප්‍රදානය කෙරේ.

උදාහරණයක් ලෙස, කාඩ්පත් හිමියා විසින් HSBC ක්‍රෙඩිට් කාඩ්පත මගින් රු.9,556/- ක උපයෝගිතා බිල්පත් ගෙවීමක් සිදු කර, ඉන් පසුව රු. 15,753/- පාසල් ගාස්තු ලෙස වියදම් කරයි. ගණනය කළ මුළු Rewards ලකුණු පහතින් දක්වා ඇත:

| | කාණ්ඩය | වියදම් කළ මුදල | සුදුසුකම් ලත් **RP** | සමස්ත **RP** |
|---|---|---|---|---|
| a. | උපයෝගිතා බිල්පත් (අන්තර්ජාලය හරහා නොගෙවූ) | රු.9,556/- | 1X | **48** (රු.**47.78** Rs.**48**ක් දක්වා වැටයීම) |
| b. | පාසැල් ගාස්තු | රු.15,753/- | 2X (Rewards ගුණකය) | **158** (රු.**157.53** රු.**158**ක් ලෙස වැටයීම) |
| | උපයාගත් සමස්ත **Rewards** ලකුණු ගණන | | | **206** |

2.9 ලිත් මාසය තුළ කාඩ්පත් හිමියාට බිල් කරන ගනුදෙනු පමණක් සුදුසුකම් ලත් ගනුදෙනු ලෙස සලකනු ලැබේ. කාඩ්පත් හිමියන්ට වැඩිදුර දැනුම්දීමකින් තොරව වැඩසටහනේ දී සුදුසුකම් ලත් ගනුදෙනු පිළිබඳ අවසන් නිර්වචනය තීරණය කිරීමට බැංකුවට අයිතිය පවතී. මතභේද ඇති වන අවස්ථාවක, බැංකුවේ තීරණය අවසාන සහ තීරණාත්මක වනු ඇත. **2019** ජූලි මස **15** දිනට පෙර සිදු කරන ලද ගනුදෙනු සඳහා Rewards ලකුණු ප්‍රදානය නොකෙරේ.

2.10 එක් එක් අලෙවිකරු සඳහා වෙළඳ කාණ්ඩයේ කේතය (MCC) සහ වෙළඳ අනන්‍යතා විස්තරය (MID) නියම කිරීම අදාළ වෙළෙන්දාගේ අය කරගන්නා බැංකුව විසින් සිදු කරනු ලබන අතර නිවැරදි MCC සහ MID නියම කිරීම අදාළ අයකර ගන්නා බැංකුවේ වගකීම වේ. අයකර ගන්නා බැංකුව විසින් MCC සහ MID වැරදි ලෙස නියම කිරීම හේතුවෙන් සුදුසුකම් ලත් කාඩ්පත් හිමියාගේ HSBC ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමට අතිරේක ප්‍රතිලාභ ලකුණු බැර කරනු නොලැබුණහොත්, HSBC හි පාලනයෙන් බැහැර පවතින එවැනි විෂමතා සඳහා කිසිදු ආකාරයකින් HSBC වගකියනු නොලබන බවට සුදුසුකම් ලත් කාඩ්පත් හිමියා එකඟ වේ.

3.0 Rewards හවුල්කාර ආයතනවල කිසියම් වෙනස්කමක් ඇතුළුව Rewards වලට අදාළ මෙම නීතිරීති සහ කොන්දේසි වෙනස් කිරීමට සහ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුම් ප්‍රකාශය/ HSBC පොදු වෙබ්අඩවිය/ කෙටි පණිවිඩ සේවාව හෝ හෝ වෙනත් සුදුසු සන්නිවේදන මාධ්‍යයක් මගින් ප්‍රකාශයක් ලෙස හෝ ඇතුළත් කිරීමක් ලෙස එවැනි වෙනස්කම් බැංකුවට සුදුසු යැයි හැඟෙන පරිදි කාඩ්පත් හිමියන් වෙත සන්නිවේදනය කිරීමට බැංකුවට අයිතිය පවතී.

4.0 මෙම නීතිරීති සහ කොන්දේසි, කලින් කලට සංශෝධනය කළ හැකි අතර, මෙම වැඩසටහන ප්‍රචාරණය කරන වෙනත් ප්‍රවර්ධන ද්‍රව්‍යවල අඩංගු ඕනෑම ප්‍රතිපාදනයක් හෝ නියෝජනයක් අභිබවා මෙය බලපැවැත්විය යුතුය.

5.0 මෙම නීතිරීති සහ කොන්දේසි, කාඩ්පත් හිමියන්ගේ ගිවිසුම කොටසක් ලෙස පවතින, HSBC බැංකුව විසින් ක්‍රෙඩිට් කාඩ්පත් පහසුකම් සැපයීම නියාමනය කරන HSBC ක්‍රෙඩිට් කාඩ්පත්වල (“GTCs”) සාමාන්‍ය නීතිරීති සහ කොන්දේසි සහ HSBC Rewards වැඩසටහන සඳහා පවතින නීතිරීති හා කොන්දේසි වලට අමතරව වේ. සාමාන්‍ය නීතිරීති හා කොන්දේසි සහ HSBC Rewards වැඩසටහන සඳහා වන නීතිරීති හා කොන්දේසි HSBC පොදු වෙබ්අඩවිය වන www.hsbc.lk මගින් ලබාගත හැකිය.

6.0 මෙම නීතිරීති සහ කොන්දේසි, සාමාන්‍ය නීතිරීති හා කොන්දේසි සහ HSBC Rewards වැඩසටහන සඳහා වන නීතිරීති හා කොන්දේසි අතර අනනුකූලතාවක් පවතින අවස්ථාවකදී, මෙම වැඩසටහනට අදාළ වන තාක් දුරට සාමාන්‍ය ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා වන නීතිරීති සහ කොන්දේසි බලපැවැත්වේ.

7.0 සැක දුරු කිරීම සඳහා, HSBC බැංකුව විසින් මෙම වැඩසටහනේ, අවලංගු කිරීම, අවසන් කිරීම හෝ අත්හිටුවීම මගින් එකී අවලංගු කිරීමේ, අවසන් කිරීමේ හෝ අත්හිටුවීමේ ක්‍රියාවේ ඍජු හෝ වක්‍ර ප්‍රතිඵලයක් ලෙස, සුදුසුකම් ලත් කාඩ්පත් හිමියන්ට සිදු වන හෝ සිදු කරන ලද කිසිදු පාඩුවක් හෝ හානියක් සඳහා HSBC බැංකුවට එරෙහිව කිසිදු හිමිකම් පෑමක් හෝ වන්දියක් ලබා ගැනීමට සුදුසුකම් ලත් කාඩ්පත් හිමියන්ට හිමිකම් නොපවතී.

7.1 මෙම වැඩසටහනට අදාළ සියලුම කාරණා වලදී HSBC බැංකුවෙහි තීරණය අවසාන සහ තීරණාත්මක වේ.

7.2 මෙම වැඩසටහනට අදාළව අදාළ නීති යටතේ සුදුසුකම් ලත් කාඩ්පත් හිමියන් වෙතින් අය කළ හැකි සියලුම බදු, ගාස්තු, රජයේ ගාස්තු හෝ වෙනත් අයකිරීම් සඳහා සුදුසුකම් ලත් කාඩ්පත් හිමියන් පෞද්ගලිකව වගකිව යුතුය.

7.3 කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත නැතිවී ගියහොත් හෝ සොරකම් කරන ලදහොත්, කාඩ්පත් හිමියාට ප්‍රතිස්ථාපන ක්‍රෙඩිට් කාඩ්පත සමඟින් මිලදී ගැනීම් දිගටම කරගෙන යා

හැකි අතර සිදු කරන ලද සියලුම මිලදී ගැනීම් මෙම වැඩසටහන සඳහා අඛණ්ඩව සුදුසුකම් ලබයි.

8.0 යම් මතභේදයට තුඩු දී ඇති, ආපසු හැරවූ/ආපසු ගෙවන ලද හෝ අවලංගු කරන ලද/නිෂ්ප්‍රභ වූ ගනුදෙනු වැඩසටහන සඳහා සුදුසුකම් ලත් ගනුදෙනුවක් ලෙස සලකනු නොලබන අතර, එකී ගනුදෙනු සම්බන්ධයෙන් ඉපැයූ Rewards ලකුණු බැංකුව විසින් ආපසු හරවනු ලැබේ.

9.0 මෙහි දැක්වෙන කිසිවක් මගින් බැංකුව විසින් මෙවැනි වැඩසටහන් අනාගතයේ පැවැත්වීමට කිසිදු කැපවීමක් හෝ නියෝජනයක් සිදු නොවේ.

10.0 අලෙවිකරුවන් විසින් පිරිනමන සැලසුම් සහ/හෝ සේවාවන් හි සැපයුම්කරුවා HSBC නොවන අතර, ඊට අදාළව කිසිදු වගකීමක් භාර නොගනු ඇත.

11.0 අන්‍යාකාරයකින් සඳහන් කර නොමැති නම්, මෙම වැඩසටහන වෙනත් කිසිදු HSBC ක්‍රෙඩිට් කාඩ්පතකට අදාළ නොවේ.

12.0 මෙම වැඩසටහනට අදාළ සියලුම ලිඛිත සන්නිවේදනයන් කළමනාකරු, ක්‍රෙඩිට් කාඩ්පත් භාවිතය සහ හවුල්කාරිත්වය, ද හොංකොං සහ ෂැංහායි බැන්කිං කෝපරේෂන් ලිමිටඩ්, අංක 163, යුනියන් පෙදෙස, කොළඹ 02 යන ලිපිනයට යොමු කළ යුතුය. බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථාන අංකය වන 4 4722 00 අංකයෙන් හෝ personalbanking@hsbc.com.lk යන විද්‍යුත් ලිපිනය හරහා විමසීම් කළ හැකිය.

13.0 මෙම නීතිරීති හා කොන්දේසි ශ්‍රී ලංකාවේ නීතිය මගින් පාලනය වන අතර ඊට අනුව අර්ථනිරූපනය කෙරෙනු ඇති අතර, ශ්‍රී ලංකාවේ අධිකරණ වල අනන්‍ය අධිකරණ බලයට යටත් වනු ඇත.